## Abstract 47

# මනුෂ්‍යත්වයේ ආචාර විද්‍යාත්මක පදනම

**කේ. ප්‍රමෝද්‍ය චතුරංග,**
(ශාස්ත්‍රවේදී, ප්‍රථම වසර),
*pramodyachaturanga@gmail.com*

මෙම පර්යේෂණයේ විෂය පථය වන්නේ ආදි බෞද්ධ දර්ශනය හා සම්බන්ධ ආචාර විද්‍යාත්මක පදනම යි. මුල් බුදුසමයේ ආචාර විද්‍යාව පිළිබඳ සෑම ඉගැන්වීමක ම න්‍යෂ්ටිය වන්නේ **මනුෂ්‍යත්වය** පිළිබඳ සංකල්පය යි. **මනුෂ්‍යත්වය** යනු මනස මුල්කොට පවතින කායික චර්යාවකට දී ඇති සංඥා නාමයකි. මෙම චර්යාව හොඳ සහ නරක යන ධර්මතා දෙකෙන් ම සමන්විත වන්නකි. බුද්ධත්වය දක්වා ආත්මභාවයන්හි බෝධිසත්ත්වවරයෙකු වශයෙන් සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ පවා මෙම ගුණාංග දෙක සමඟ පැවැත්මක් සිදු කොට ඇති බව බෞද්ධ ග්‍රන්ථවල අව්‍යාජව පවසා තිබීම මෙයට සාධකයක් වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මනුෂ්‍යත්වය පිළිබඳව සාකච්ඡා කිරීම නොව තදනුබද්ධ ආචාර ධර්ම පිළිබඳ ප්‍රායෝගික භාවිතය සම්බන්ධ විග්‍රහයක යෙදීම යි. මනුෂ්‍යත්වය සුරක්ෂිත කිරීම සමාජයක් වශයෙන් කවර සමාජ සන්දර්භයක වුවද වගකීමකි. එයට ආගම්, කුල, ගෝත්‍රාදී සීමා මායිම් තිබිය නො හැකි ය. එසේ නො වුණහොත් චර්යාමය වශයෙන් තිරශ්චීන සමාජයකට වඩා වෙනස් නොවේ. එබැවින් ආචාර ධර්ම විශේෂයන් පොදු මනුෂ්‍ය සමාජය විසින් හඳුනාගෙන ඇත. බුදුදහම මනුෂ්‍යත්වයට ආරෝපණය කරන ගුණාංග විශිෂ්ට මානව සමාජයක් බිහි කිරීමට උපස්තම්භක වන බව පෙරදිග මෙන් ම බටහිර ලෝකය විසින් හඳුනාගෙන ඇත. එහෙත් ඇතම්විට සංස්කෘතිය විසින් නිර්මාණය කිරීමට වෑයම් කෙරෙන මනුෂ්‍යත්වය තුළ විවාදාපන්න කතිකාවත් ගොඩ නැගේ. එහෙයින් මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සැබෑ මනුෂ්‍යත්වය පෝෂණය කිරීමට අදාළ කරගත හැකි ඉගැන්වීම පදනම් කොට ගනිමින් සීමා ව්‍යතිරේක රහිතව පොදු සමාජයට සම්ප්‍රේෂණය කළ හැකි මනුෂ්‍යත්වය සම්බන්ධ බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ අනාවරණයක යෙදීම යි.

**ප්‍රමුඛ පද:** ආචාර විද්‍යාව, බෞද්ධ දර්ශනය, මනුෂ්‍යත්වය, මුල් බුදුසමය